SEC | SECURITIES AND EXCHANGE COMMISSION OF SRI LANKA

## ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

## මාධ්‍ය නිවේදනය

2017 නොවැම්බර් මස **28**

---

## කොළඹ පැවති දෙවන ආයෝජක වැඩමුළුවටත් ඉහළ ජනතා ප්‍රතිචාරයක්

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, කොළඹ කොටස් හුවමාරුව සමග එක්ව ශ්‍රී ලංකා ජාතික රූපවාහිනී නාලිකාවේ මාධ්‍ය අනුග්‍රහය ඇතිව පවත්වනු ලබන "කොටස් වෙළෙඳපොළ නගරයෙන් නගරයට" සම්මන්ත්‍රණ මාලාවේ 6 වන සම්මන්ත්‍රණය නොවැම්බර් මස 28 දින කොළඹ ගාළු මුවදොර රමාඩා හෝටලයේදී (Ramada Hotel) සාර්ථකව පවත්වන ලදී. මෙය කොළඹදී පැවති දෙවැනි ආයෝජක සම්මන්ත්‍රණය විය. මීට පෙර පැවති ආයෝජක සම්මන්ත්‍රණ සඳහා මෙන්ම පුළුල් ආයෝජක සහභාගීත්වයක් මෙම සම්මන්ත්‍රණය සඳහාද පැවති අතර 350 ට අධික සහභාගීකරුවන් කොටස් වෙළෙඳපොළ ආයෝජනය පිළිබඳව දැනුවත් වීමේ අරමුණින් ඒ සඳහා සහභාගීවී සිටියහ.

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ බාහිර සම්බන්ධතා අංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර කළමනාකරු නිමල් කුමාරසිංහ මහතා වැඩසටහන මෙහෙයවීම සිදු කළ අතර ඉන් අනතුරුව "සාර්ව ආර්ථික සමාලෝචනය" සම්බන්ධයෙන් වූ දේශනය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා වානිජ පීඨයේ මූල්‍ය අංශ ප්‍රධානී මූල්‍ය පිළිබඳ මහාචාර්ය හරේන්ද්‍ර දිසාබණ්ඩාර මහතා විසින්ද, කොළඹ කොටස් හුවමාරුවේ "ව්‍යාපාර ක්ෂේත්‍රයන්හි කාර්යසාධනයන් සහ වෙළෙඳපොළ ආයෝජන අවස්ථා" සම්බන්ධයෙන් වූ දේශනය කැන්ඩර් ඉක්විටීස් පුද්ගලික සමාගමේ පර්යේෂණ ප්‍රධානී පසිඳු පෙරේරා මහතා විසින්ද සිදු කළහ.

ප්‍රධාන දේශන වලින් අනතුරුව විද්වත් මණ්ඩල සාකච්ඡාව ඇරඹුණු අතර පැමිණ සිටි ආයෝජකයන්ට දේශන තුළින් මතුවූ ප්‍රශ්න සහ ගැටළු සාකච්ඡා කිරීමට ආයෝජකයන්ට අවස්ථාව  උදාවිය. ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ බාහිර සම්බන්ධතා අධ්‍යක්ෂ තුෂාර ජයරත්න මහතා විසින් විද්වත් මණ්ඩලය සාකච්ඡාව මෙහෙයවූ අතර ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් වජිර විජේගුණවර්ධන මහතා, කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවේ ප්‍රධාන විධායක නිලධාරී රජීව බණ්ඩාරනායක මහතා සහ ප්‍රධාන දේශකයින් දෙපල විද්වත් මණ්ඩල සාකච්ඡාවට එක්වූ සාමාජිකයින් වේ.

මෙවැනි මහජන සම්මන්ත්‍රණ සඳහා පැවති විශාල ජනතා සහභාගීත්වය සහ ඔවුන් වෙතින් ලැබුණු  ප්‍රතිචාර මත ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් හුවමාරුව 2018 වර්ෂයේදීද මෙම ආයෝජක සම්මන්ත්‍රණ මාලාව අඛණ්ඩව පවත්වාගෙන යාමට බලාපොරොත්තු වේ.

නිකුත් කළේ,

අධ්‍යක්ෂ බාහිර සම්බන්ධතා සහ ආවේක්ෂණ

SEC SECURITIES AND EXCHANGE COMMISSION OF SRI LANKA
Level 28-29, East Tower, World Trade Center
Echelon Square, Colombo 01, Sri Lanka
Phone: (+94 11) 2143843 ext 190
Direct (+94 11) 2143834
Fax : (+94 11) 2439149
E-Mail: tushara@sec.gov.lk
Website: http://www.sec.gov.lk